# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2415/66 - 2024 දෙසැම්බර් මස 21 වැනි සෙනසුරාදා - 2024.12.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත**

2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 09 වන වගන්තිය පරිදි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත උපලේඛනවල සඳහන් අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබූ දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රකාශයට පත් කරමි.

2024 මැයි මස 17 වැනි දිනැති අංක 2384/30 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය මෙයින් අවලංගු කරමි.

අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2024 ක් වූ දෙසැම්බර් මස 20 වැනි දින.

1A - G 43340 - 379 (2024/12)

*සැ.යු.- මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය**

**I වන උපලේඛනය**

***2025 ජනවාරි මස සිට අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමවේදය***

| | සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලබන සමාජ කාණ්ඩය | ගෙවනු ලබන කාල සීමාව | සුබසාධක ප්‍රතිලාභී තැනැත්තන්/පවුල් සංඛ්‍යාව * | පවුල් ඒකකයක් සඳහා වන යෝජිත මාසික සුබසාධක ප්‍රතිලාභ දීමනාව (රු.) ** |
|---|---|---|---|---|
| I. | සංක්‍රාන්තික | 2025 ජනවාරි මස සිට 2025 මාර්තු මස දක්වා එකී මාස දෙකද ඇතුළත්ව | 480,000 | 5,000 |
| II. | අවධානමට ලක්වූ | 2025 ජනවාරි මස සිට 2025 දෙසැම්බර් මස දක්වා එකී මාස දෙකද ඇතුළත්ව | 480,000 | 5,000 |
| III. | දුප්පත් | 2025 ජනවාරි මස සිට 2026 ජූනි මස දක්වා එකී මාස දෙකද ඇතුළත්ව | 960,000 | 10,000 |
| IV. | අන්ත දිළිඳු | 2025 ජනවාරි මස සිට 2026 ජූනි මස දක්වා එකී මාස දෙකද ඇතුළත්ව | 480,000 | 17,500 |

*** සටහන -** මෙම සංඛ්‍යාත්මක අගයන් ප්‍රතිලාභී පවුල් ගණනය කිරීම් අනුව සුළු වෙනස්කමකට ලක්විය හැක.

**** සටහන -** පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව 02 හෝ 02 ට අඩු වන අවස්ථාවක ප්‍රතිලාභීන් සඳහා උක්ත දීමනාවෙන් අඩක් පමණක් ගෙවිය යුතුය.

**II වන උපලේඛනය**

**වෙනස් හැකියාවන් සහිත තැනැත්තන්, හඳුනානොගත් වකුගඩු රෝගීන්, වැඩිහිටි ආධාර ලබන තැනැත්තන් සඳහා ගෙවීම්**

| සුබසාධක ප්‍රතිලාභ ලබන සමාජ කාණ්ඩය | | ප්‍රතිලාභ සඳහා හිමිකම් ලබනු ඇතැයි අපේක්ෂිත තැනැත්තන් සංඛ්‍යාව | මාසික සුබසාධක ප්‍රතිලාභ දීමනාව (රු.) |
|---|---|---|---|
| (i) | ආධාර ලබන වෙනස් හැකියාවන් සහිත තැනැත්තන් | 410,000 | 7,500 |
| (ii) | වකුගඩු ආධාර ලබන තැනැත්තන් | 50,000 | 7,500 |
| (iii) | වැඩිහිටි ආධාර ලබන තැනැත්තන් | 820,000 | 3,000 |

**සටහන -** **II වන උපලේඛනයෙහි සඳහන් ගෙවීම් 2025 ජනවාරි සිට 2025 ජූනි මස දක්වා එකී මාස දෙකද ඇතුළත්ව ගෙවිය යුතුය. සුබසාධක ප්‍රතිලාභ ලේඛනය තුළින් හඳුනාගනු ලැබූ ප්‍රතිලාභීන් සඳහා 2025 ජනවාරි මස සිට එකී මාසයද ඇතුළත්ව අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ක්‍රමවේදය හරහා ප්‍රතිලාභ ගෙවීම් සිදු කරනු ලැබිය යුතුය.**

2024 මැයි මස 17 දිනැතිව අංක 2384/30 දරන *ගැසට්* පත්‍රයේ පළකරන ලද අස්වැසුම සුභසාධක ගෙවීමේ යෝජනා ක්‍රමය මෙයින් අවලංගු කරන අතර, එහෙත් එහි I වන උපලේඛනයට සහ II වන උපලේඛනයට අදාළව මේ වන විටත් ප්‍රතිලාභ සඳහා තෝරාගෙන ඇති හා විවිධ හේතු මත ගෙවීම් සිදු කිරීම ප්‍රමාදව ඇති ප්‍රතිලාභීන්ද, අභියාචනා ඉදිරිපත් කර මේ වන විටත් විභාග කෙරෙමින් පවතින අයදුම්කරුවන් සඳහා ද ඔවුන්ගේ සුදුසුකම් ලැබීම මත එකී ගෙවීම් 2024.12.31 දක්වා ගෙවිය යුතුය.

EOG 12-0226

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.